# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | සංගීතය (පෙරදිග) - I | කාලය පැය 01 යි |
|---|---|---|

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*

1. සප්තකයේ ඇති අචල ස්වර වනුයේ,
   (1) ස , ම (2) ස, ග (3) ස , ධ (4) ස , ප

2. භෛරවී රාගයේ දී ශුද්ධ රි ග ධ නි සහ තීව්‍ර ම යන ස්වර,
   (1) වර්ජිත වේ. (2) අනුවාදි වේ. (3) විවාදි වේ. (4) විකෘති වේ.

3. භූපාලි රාගයට අදාළ නොවන වරණය තෝරන්න.
   (1) ගාන සමය රාත්‍රි දෙවන ප්‍රහාරය වේ. (2) ම සහ නි වර්ජිත ස්වර වේ.
   (3) ජාතිය ඖඩව වේ. (4) සියලුම ස්වර ශුද්ධ වේ.

4. නි̣රි ගම් පධ නිස̇ | නිධ පම් ගරි ස- යන තානාලංකාරය,
   (1) යමන් රාගයට අයත් ගමක තානයක් වේ.
   (2) යමන් රාගයට අයත් සපට් තානයක් වේ.
   (3) යමන් රාගයට අයත් මිශ්‍ර තානයක් වේ.
   (4) යමන් රාගයට අයත් අලංකාරික තානයක් වේ.

5. සරි ගරිස- , සරි ගපගරිස- ,සරි ගපධපගරිස- යනු නිර්දේශිත රාගයකට අදාළ ස්වර අභ්‍යාසයකි.මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර වන්නේ,
   (1)සරි ගපමගමරිස- (2) සරි ගපධනිධපගරිස-
   (2) සරි ගපධස̇ධපගරිස- (3) සරි ගපධස̇ධපමගරිස-

6. කර්ණාටක් සංගීත පද්ධතියට අනුව වයලීනයේ තත් සුසර කරනු ලබන්නේ,
   (1) ප̣ ස ප ස̇ (2) ප̣ රි ධ ග̣
   (3) ස̣ ප̣ ස ප̇ (4) ම̣ ස ප රි

7. මූලික රාග ජාති ප්‍රභේද තුනෙන් සම්පූර්ණ රාග ජාති කීයක් ගොඩනැගේ ද?
   (1) 9 යි. (2) 7 යි. (3) 8 යි. (3) 6 යි.

8. මධ්‍ය ස ස්වරයට වඩා උච්ච ස ස්වරයේ හඬ ඉහළ වනුයේ,
   (1) සංඛ්‍යාතය වැඩි නිසාය. (2) විස්තාරය විශාල නිසාය.
   (3) විපුලතාවය වැඩි නිසාය. (4) පෙළීමේ බර වැඩි නිසාය.

9. **" Harmony "**යන සිද්ධාන්තය මත ගොඩනැගී ඇති සංගීතය වන්නේ,
   (1) හින්දුස්ථානි සංගීතය (2) අපරදිග සංගීතය
   (3) කර්ණාටක් සංගීතය (4) පෙරදිග සංගීතය

10. තානාලංකාර සිතාර්,වයලින් ආදී භාණ්ඩ සඳහා යොදා ගන්නා විට ඊට,

(1) ජෝඩ් යැයි ව්‍යවහාර කරයි. (2)පකඩ් යැයි ව්‍යවහාර කරයි.
(3) තෝඩා යැයි ව්‍යවහාර කරයි. (4) මුඛඩා යැයි ව්‍යවහාර කරයි.

11. අපරදිග සංගීතයෙහි Time signature ලෙස ලියනු ලබන $\frac{5}{8}, \frac{7}{8}$ යන තාල පෙන්වන සංකේතයන් පිළිවෙළින්,

(1) හින්දුස්ථානි සංගීතයේ කෙහෙර්වා සහ ත්‍රිතාල රූපයන්ට සමාන වේ.
(2) හින්දුස්ථානි සංගීතයේ ජප් සහ කෙහෙර්වා තාල රූපයන්ට සමාන වේ.
(3) හින්දුස්ථානි සංගීතයේ දීප්චන්දි සහ ත්‍රිතාල රූපයන්ට සමාන වේ.
(4) හින්දුස්ථානි සංගීතයේ ජප් සහ දීප්චන්දි තාල රූපයන්ට සමාන වේ.

12. ශුද්ධ ගාන්ධාරය හා ශුද්ධ නිෂාදය සතුරු ස්වර ලෙස යෙදෙන නිර්දේශිත රාගය වන්නේ,

(1)භෛරවී (2) කාෆි (3) යමන් (4) බිලාවල්

- අංක 13 සිට 16 තෙක් ඇති ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.

A



B



C



D



13. වම් පැත්ත සුරල් පැත්ත වන අතර, දකුණු පැත්ත හයි ගහන පැත්ත යන පාරිභාෂික වචන භාවිතා වන භාණ්ඩය වන්නේ,

(1) A (2) B (3) C (4) D

14. B අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩයෙන් වාදනය වන පද විශේෂයක් වන්නේ,

(1) කිටිතක දොම්කිට ජෙං තක දොම්කිට (2) තකුම තරිකිට දිකුම තරිකිට
(3) තකු ජිං ජිං තත් ජිං තක ජිං කුඳ (4) ගුම් ගුඳ ගදි ගත ගදි ගත ගදිගත

15. C අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදාගනු ලබන රංග ශෛලිය සඳහා පාදක වී ඇති සංගීත සම්ප්‍රදාය වන්නේ,

(1) කර්ණාටක් සංගීතයයි. (2) හින්දුස්ථානි සංගීතයයි.
(3) බටහිර සංගීතයයි. (4) වංග සංගීතයයි.

16. A සංගීත භාණ්ඩය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවීණ වාද්‍ය ශිල්පියෙකු වන්නේ,

(1) විශාරද බි . වික්ටර් පෙරේරා මහතා (2) විශාරද මනෝජ් පීරිස් මහතා
(3) ආචාර්ය නිෂාද් හඳුන් පතිරණ මහතා (4) ප්‍රදීප් රත්නායක මහතා

17. | ග - ම | ප - ග | ම - ග | රි - - | යන ස්වර පාදයේ විභාග මත නිවැරදිව **Chords** යොදා ඇති වරණය තෝරන්න.

C G F C
(1) |ග - ම |ප - ග | ම - ග |රි - -|

F - C G
(2) | ග - ම | ප - ග | ම - ග | රි - - |

C F G C
(3) | ග - ම | ප - ග | ම - රි |රි - - |

C - F G
(4) | ග - ම | ප - ග | ම - ග | රි - - |.




(18) ඉහත ස්වර පුවරුවේ 1, 2 සහ 3 අංක වලින් දක්වා ඇත්තේ
(1) $E^{b}$මේජර් කෝඩ් එකට අයත් ස්වරයි.
(2) $E^{b}$මයිනර් කෝඩ් එකට අයත් ස්වරයි.
(3) $F^{\#}$මේජර් කෝඩ් එකට අයත් ස්වරයි.
(4) $C^{\#}$මේජර් කෝඩ් එකට අයත් ස්වරයි.

(19) **" තු ගංගා කි මෞජුමේ "** යන ගීතය,1952 වර්ෂයේ තිරගත වූ
(1) කොහිනූර් චිත්‍රපටයේ ගීතයකි.
(2) මධුමති චිත්‍රපටයේ ගීතයකි.
(3) බෛජු බව්රා චිත්‍රපටයේ ගීතයකි.
(4) පාකිෂා චිත්‍රපටයේ ගීතයකි.

(20) | කො බෝ s | කු රු ලු | ව නේ s |ss ss ss |මෙම ගී පාදයේ,
(1) සඳැස්මත් නමයකි,ගී මත් දාසයකි.
(2) සඳැස්මත් දොළහකි,ගී මත් නමයකි.
(3) සඳැස්මත් නමයකි,ගී මත් දොළහකි.
(4) සඳැස්මත් දොළහකි,ගී මත් දාසයකි.

(21) පහත ගී පාද අතුරින් අටවිසිමත් සේගී ගණයට අයත් වනුයේ,
a. මන් මත් කරවන දනමුළු දෙරණා යන පැදියයි.
b. රූ රුසේ අදිනා ලෙසේ අත් ලෙලදිදි විදුලිය පබා යන පැදියයි.
c. සඳවා සුදු වැලි පිවිතුරු යන පැදියයි.
d. පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට යන පැදියයි.

(22) සබරගමු කෝකිල වන්නම,
a. මැදුම් සහ දෙසුළු මැදුම් තුන්තිත අනුව ගැයේ.
b. මැදුම් සහදෙසුළු මහ තුන්තිත අනුව ගැයේ.
c. මැදුම් සහ දෙසුළු දෙමහ සිවුතිත අනුව ගැයේ.
d. මැදුම් සහ තුන් සුළු දෙමහ පස්තිත අනුව ගැයේ.

(23) " ඇඳුරු කුමා වන්න මගේ "යන ගීතය,
(1) හෙන්රි ජයසේනයන් ගේ - හුණුවටය නාට්‍යයේය.
(2) දයානන්ද ගුණවර්ධනයන් ගේ - නරි බෑනා නාට්‍යයේය.
(3) බන්දුල ජයවර්ධනයන්ගේ - බෙරහඬ නාට්‍යයේය.
(4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ - ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේය.

(24) ඉයුජින් නාඩගමේ එන " **යානත අතුළ මල් පෙති** "ගීතය ඇසුරින් නිර්මාණය වූ නව නාට්‍ය ගීතය කුමක් ද?
(1) රුසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා
(2) මෑ වේ මා දුටු කොමළ ලියා
(3) බුදු තුල් ගුණැති සමිඳුනි
(3) සේ සුරිඳු බරණැස් පුරපසිඳු

(25) පංච තාලය පිළිබඳව නිදර්ශන සහිතව බෙර වාදනය කිරීමද,මල් සරා බැල්ම හෙළා සහ දැසමන් මලක් වගෙයි යන ගීත ගායනයෙන්ද දායකවූ ශ්‍රී ලාංකික සංගීතඥයා,
(1) ලයනල් රංවල සූරීන්ය.
(2) රෝහණ බැද්දගේ සූරීන්ය.
(3) සී.ද.එස්.කුලතිලක සූරීන්ය.
(4) ඩබ්.ඩී අමරදේව සූරීන්ය.

(26) තබ්ලා වාදන අංගයක් **නොවන්නේ,**
(1) කායදා (2) පල්ටා (3) ජෝඩ් (4)තිහායි

(27) සිතාරයේ සහ එස්රාජයේ ප්‍රධාන තත් සුසර කරනුයේ,
(1) ෂඩ්ජ ස්වරයටය.
(2) මධ්‍යම ස්වරයටය.
(3) මන්ද්‍ර ෂඩ්ජ ස්වරයටය.
(4) මන්ද්‍ර මධ්‍යම ස්වරයටය.

- **පහත A, B සහ C අක්ෂර වලින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ නාට්‍ය සම්ප්‍රදායන් හතරකට අයත් රූප සටහන් වේ.ඒ** ඇසුරින් 28 සිට 32දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**A**



**B**



**C**



**D**



(28) ඉහත **A, B** සහ **C** අක්ෂර වලින් හඳුන්වා දෙනු ලබන නාට්‍ය නම් කළ යුත්තේ,
a. A - කෝළම් , B - නව නාට්‍ය , C - මුද්‍රා නාට්‍ය , D - සොකරි
b. A - නව නාට්‍ය , B - මුද්‍රා නාට්‍ය , C - සොකරි, D - කෝළම්
c. A - සොකරි , B - කෝළම් , C - නව නාට්‍ය , D - මුද්‍රා නාට්‍ය
d. A - මුද්‍රා නාට්‍ය , B - සොකරි , C - කෝළම් , D - නව නාට්‍ය

(29) " **තානායම් පොළ** "නමින් හඳුන්වනු ලබන එළිමහන් වේදිකාවක රඟ දක්වනු ලබන නාට්‍ය සම්ප්‍රදාය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(30) අනුරූපණ මාධ්‍යයෙන් කථාව ඉදිරිපත් කරන නාට්‍ය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(31) ක්‍රි.ව. 1956 දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ගේ නාට්‍යයක් ඇසුරින් ආරම්භ වූ නාට්‍යයක් වන්නේ,
(1) A ය. (2) B ය. (3) Cය. (4) D ය.

(32) වාචික අභිනයෙන් තොරව සංගීතය ප්‍රධාන කොට ගෙන ඉදිරිපත් කරන නාට්‍ය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(33) නෙළුම් ගී නාද රටා ඇසුරින් නිර්මාණය වී ඇති සරල ගීයකි
(1) දෑතට වළලු මල් මුතුවැල් (2) සැඳෑ කළුවර කුරගගා
(3) ජය සිරි මහ බෝධි (4) රන්වන් කරල් සැලෙයි

(34) මධ්‍ය ස සිට මධ්‍ය ප ස්වරය අතර අනුපාතය 2:3 කි.ස ස්වරයේ සංඛ්‍යාතය 256Hz ක් නම් ප ස්වරයේ සංඛ්‍යාතය වන්නේ,
(1) 128 Hz (2) 288 Hz (3) 320 Hz (4) 384 Hz

(35) සංගීත නිර්මාණය සහ පටිගත කිරීම යන කාර්යයන් දෙකම කළ හැකි මෘදුකාංගයක් වන්නේ,
(1) Cake Walk (2) Adobe Audition
(3) Cubase (4) Pro tools

(36) යතුරු පුවරු සංගීත භාණ්ඩ මගින් කරණු ලබන නිර්මාණ,
(1) MIDI Music (2) Ripping Music
(3) Keyboard Music (4) E Music

(37) සංගීතය රසවිඳීමට සහ බාගත කර ගැනීමට හැකි වෙබ් අඩවියක් වන්නේ,
(1) WWW. music . LK (2) WWW .encyclopedia .Com
(3) WWW. DropboX .Com (4)WWW .mediafire . Com

(38) මේජර් ස්කේලයකට අයත් ස්වර Tone, Semitone සිද්ධාන්තයට අනුව සොයන නිවැරදි ක්‍රමය වන්නේ,
a. Tone + Semitone + Tone + Tone + Semitone + Tone + Tone
b. Tone + Tone + Semitone + Tone + Tone + Tone + Semitone
c. Tone + Semitone + Tone + Tone +Tone + Semitone + Tone
d. Tone + Tone + Tone + Semitone + Tone + Tone + Semitone

(39) සාමාන්‍ය ව්‍යවහාරයේදී භාවිත වන හඬෙහි සැර යන පාරිභාෂික වචනය සංගීත විෂයෙහිදී හැඳින්වෙන්නේ,
(1) ජාති භේදය ලෙසය. (2) උච්ච නීච භේදය ලෙසය.
(3) රූප භේදය ලෙසය. (4)සංඛ්‍යාතය ලෙසය.

(40) පහත අපරදිග ප්‍රස්තාර කොටසෙහි ඊතල මගින් දක්වා ඇති සංකේත වලින් පැවසෙන්නේ,



(1) එම ප්‍රස්තාරයේ රි සහ ග ස්වර කෝමළ වන බවයි.
(2) එම ප්‍රස්තාරයේ ධ සහ නි ස්වර කෝමළ වන බවයි.
(3) එම ප්‍රස්තාරයේ ග සහ ධ ස්වර කෝමළ වන බවයි.
(4) එම ප්‍රස්තාරයේ ග සහ නි ස්වර කෝමළ වන බවයි.

| උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ஊவா மாகாண கல்வித் திணைக்களம்<br>Uva Provincial Department of Education |
|---|

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | සංගීතය (පෙරදිග) - II | කාලය පැය 02 යි |
|---|---|---|

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) ගරිගප, ධනිස් යන ස්වර සංගතිය යෙදෙන රාගයෙහි අනුවාදී ස්වර ලියන්න.

(ii) " **මනි නොමැතිව නිස පෙරයම ගැයෙනා** " යන ලක්ෂණ ගී පාදයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iii) බලි ස්ථානය පස්වන මාත්‍රාවෙහි යෙදෙන හින්දුස්ථානි තාලයේ ඨේකාව ලියන්න.

(iv) " **කෝල්** " නැමති බෙරය තාල වාදනය සඳහාත් " **එස්රාජය** " ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය ලෙසත් යොදාගනු ලබන භාරතීය ගායන ශෛලිය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) " **තෙදිනි විරාජ රුවිනි විරාජ** " යන ගීතයේ තනුව.......................................ගී ඇසුරින් නිර්මාණය වී ඇත.

(vi) සංගීත සම්භවය, විශ්ව සංගීත ක්ෂේත්‍ර, සංගීත සිද්ධාන්ත වැනි කෘතින් ................. සූරීන් අතින් බිහිවූ විශිෂ්ට ගණයේ නිර්මාණය.

(vii) ද්‍රවිඩ ආභාසයට නතුවූ දේශීය චිත්‍රපට කලාව තුළ යන්තමින් හෝ සිංහල ලකුණු සටහන් වූයේ.......................................චිත්‍රපටය තුළය.

(viii) විද්‍යුත් සංගීතය සංධ්වනි වාද්‍ය වෘන්ද සමග මුසුකර නව ආරක සංගීත නිර්මාණ බිහිකිරීමට සමත්වූ.......................................නූතන යුගයේ සංගීතඥයෙකි.

**(ලකුණු 01 x 08 = 08)**

- අංක (ix) සිට (x) හි දක්වා ඇති සංගීත භාණ්ඩ සමග ගැළපෙන කරුණු දෙක බැගින් වරහන් තුළින් තෝරා අදාළ ප්‍රශ්න අංකයද සමග පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ගජ්, නායකීතාර්, පික්, බාජ්කාතාර්, ෆ්‍රෙට්ස්, මිස්රාබ් )

| | | |
|---|---|---|
| (ix) සිතාර් | .......................... | ................................................... |
| (x) එස්රාජ් | ...................... | ................................................... |

*( ලකුණු 02x02 = 04 )*

*(ලකුණු 12)*

2. පහතින් දැක්වෙන්නේ ශිෂ්‍යයකු විසින් ගී පද මාලාවකට නිර්මාණය කළ තනුවක ස්වර ප්‍රස්තාරයකි.මෙහි ඇති විශේෂත්වය වන්නේ,මොහු මෙම තනු නිර්මාණය සඳහා නිර්දේශිත රාග තුනක ස්වර සංගතීන් යොදා ගැනීමයි.ඒ එක් එක් රාග වලට අයත් ස්වර සංගතීන් පිහිටන ස්ථාන ප්‍රස්තාරය තුළ **A, B** සහ **C** අක්ෂර මගින් දක්වා ඇත.

A (ග ප ම ග | ම රි ස -)

| ස රි ග - |ග -ගරි |ග ප ම ග| ම රි ස - |

B (නි̣ රි ග රි|ග රි ග -)

| ස - ග රි |නි̣ රි ග රි|ග රි ග -| ග - ග රි|

C (ග ප ධ ස් |ධ ප ග -)

| ග ප ධ ස් |ධ ප ග -|ග ප ම රි| ස - - - |

(i) ඉහත **A, B** සහ **C** ස්වර සංගති අයත් රාග හඳුනා ගෙන පිලිවෙළින් නම් කරන්න.*(ලකුණු 02)*

(ii) " සොඳුරුයි සීතල නිසල සැඳෑවේ
සියොතුන් ගොළුවී සැඟවේ අඳුරේ
මල් ගොමු සිප ඒ සුළඟ හමා... "
මෙම ගී පද මාලාව ඉහත ස්වර ප්‍රස්තාරයත් සමග තාලානුකූලව නැවත පද ප්‍රස්තාර කරන්න. *(ලකුණු 04)*

(iii) ඉහත ඔබ නම් කළ රාග තුනෙන් එක් රාගයකට අයත් **මධ්‍යලය ගීතයක / වාදිතයක** ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iv) **B** රාගයෙහි "ම"ස්වරය සම්බන්ධව කුමක් කිව හැකිද? *(ලකුණු 02)*

(ලකුණු 12)

3. **A** සහ **B** යනුවෙන් දැක්වෙන්නේ නිර්දේශිත රාග දෙකකට අයත් ලක්ෂණ ගීත පටන් ගන්නා ආකාරයයි.

**A** - වියොව කුළුණ සිරිගර රස....

**B** - සැම ප්‍රිය කරනා ඉමිහිරි....

(i) **A** සහ **B** යන ලක්ෂණ ගීතවලින් පිළිබිඹු වන රාග පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02)*

(ii) එම ලක්ෂණ ගීත අතුරින් එක් ගීතයක හෝ එම රාගයන්ට අයත් නිර්දේශිත වෙනත් ලක්ෂණ ගීතයක හෝ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. *(ලකුණු 05)*

(iii) B ගීතය සඳහා වාදනය කළ හැකි තාලයේ සම්පූර්ණ මාත්‍රා සංඛ්‍යාවෙන් A ගීතය සඳහා වාදනය කළ හැකි තාලයේ සම්පූර්ණ මාත්‍රා සංඛ්‍යාව අඩු කළ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන මාත්‍රා සංඛ්‍යාවකින් යුත් නිර්දේශිත තාලය නම් කර, එම තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. *(ලකුණු 05)*

*(ලකුණු 12)*

4. (i) කෙත ආශ්‍රිතව ගොඩනැගුණු ගැමි ගී වර්ග **තුනක්** නම් කර,ඒ‌එකිනෙකට ගැළපෙන ගී පාදය බැගින් ලියන්න. *(ලකුණු 02)*

(ii) එම ගීත වර්ග අතුරින් **එක් ගීතයක්** තෝරාගෙන, එහි ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. *(ලකුණු 04)*

(iii) කවිකාර මඩුව ආශ්‍රිතව ගොඩනැගුණු ගීත වර්ග **තුනක්** නම් කර ඒ එකිනෙකට ගැළපෙන ගී පාදය බැගින් ලියන්න. *(ලකුණු 02 )*

(iv) ඉහත (i) යටතේ නම් කළ ගීත වර්ගය හා (iii) යටතේ නම් කළ ගීත වර්ගය අතර **විශේෂ ලක්ෂණ හතරක්** යටතේ සැසඳීමක් කරන්න. *(ලකුණු 04)*

*(ලකුණු 12)*

5. (i) පහත සඳහන් වගුවෙහි එක් එක් තීරුවල ඇති කොටස් මාරු වී ඇත.එම කොටස් **A** තීරුවේ සඳහන් ව්‍යවහාරික ගීත වර්ගය සමඟ නිවැරදිව සම්බන්ධ කර ගනිමින් නැවත වගුගත කරන්න. *(ලකුණු 04)*

| | A | B | C | D |
|---|---|---|---|---|
| අ | චිත්‍රපටි ගීත | ඕලු පිපිලා වෙල ලෙල දෙනවා.. | ලක්ෂ්මී බායි | මූන්ස්ටෝන් |
| ඇ | ගුවන් විදුලි සරල ගීත | මංගෝ කලු නැන්දේ.. | සුනිල් ශාන්ත | ගැටවරයෝ |
| ඉ | කණ්ඩායම් ගීත | පිට දීප දේශ ජයගත්තා.. | නාරද දිසාසේකර | හිස් මාස්ටර්ස් වොයිස් |
| උ | ග්‍රැමෆෝන් ගීත | හාරිච්චි බෝරිච්චි.. | ඇනස්ලි මාලේවන | හෙළ රිදී වළාව |

(ii) ඉහත 'ඇ' සහ 'උ' යන ගීත වර්ග වලට අදාළව වගුවෙහි සඳහන් නොවන මුල් කාලීන වෙනත් ගායක,ගායිකාවන් **දෙදෙනෙකු** බැගින් පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02)*

(iii) **'ඉ'** අක්ෂරයට අයත් ගීත වර්ගය පිළිබඳව සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න. *(ලකුණු03)*

(iv) " සිනිඳු සුදුමුදු තලාවේ " ගීතය වඩාත් සිනමාරූපී සංගීතයකින් හෙබි නිර්මාණාත්මක ගීතයක් වශයෙන් අගය කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 03)*

*(ලකුණු 12)*

6. හමුදා තූර්යවාදක කණ්ඩායම්වල සහ පාසල් තූර්ය වාදක කණ්ඩායම්වල භාවිතා වන පහත දැක්වෙන සංගීත භාණ්ඩ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


**a**


**b**


**c**


**d**

(i) a, b, c සහ d යන භාණ්ඩ පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02)*

(ii) ඉහත භාණ්ඩ ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02)*

| Wind instruments | |
|---|---|
| Wood wind | Brass wind |
| ………………….. | ………………….. |
| ………………….. | ………………….. |

(iii) පහත දැක්වෙන අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරළා ලියන්න. *(ලකුණු 04)*



(iv) ඉහත ප්‍රස්තාරයේ සඳහන් ගීත වර්ගය කුමක් ද? *(ලකුණු 01)*

(v) එම ගීත වර්ගය පිළිබඳ සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න. *(ලකුණු 03)*

*(ලකුණු 12)*

7. පහත සඳහන් ප්‍රශ්න අතුරින් **හතරක්** තෝරාගෙන පිළිතුරු ලියන්න.

(i) අපරදිග සංගීතඥයකු පිළිබඳ ජීවන තොරතුරු, කළ නිර්මාණ සහ සංගීත ක්ෂේත්‍රයට ඉටුකළ සේවය පිළිබඳ කරුණු දක්වමින් කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ii) භාරතීය අපරදිග සංගීතඥයකු පිළිබඳ ජීවන තොරතුරු, ලද සම්මාන සහ සංගීත ක්ෂේත්‍රයට ඉටුකළ සේවය පිළිබඳ කරුණු දක්වමින් කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(iii) සංගීතය පටිගත කරගන්නා සහ පටිගත කළ සංගීතය නැවත ශ්‍රවණය සඳහා යොදා ගන්නා උපකරණ තුනක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iv) දේශීය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයෙහි ස්වර ප්‍රස්තාර ලිවීමේදී භාවිතා කරනු ලබන සංකේත 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(v) ප්‍රචලිත සරල ගීතයක් පිළිබඳව එහි පද මාලාව, සංගීත සංයෝජනය සහ ආභාසය ලද සංගීත ශෛලිය පිළිබඳව දක්වමින් කෙටි රසවින්දනයක් කරන්න.

*(එකකට ලකුණු 3 බැගින් 3 x 4 = 12)*

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)
# 11 ශ්‍රේණිය
# පෙරදිග සංගීතය I – II (පිළිතුරු පත්‍රය)

## 1- පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 - 4 | 11 - 4 | 21 - 2 | 31 - 3 |
| 2 - 3 | 12 - 2 | 22 - 1 | 32 - 4 |
| 3 - 1 | 13 - 4 | 23 - 4 | 33 - 1 |
| 4 - 2 | 14 - 3 | 24 - 3 | 34 - 4 |
| 5 - 3 | 15 - 1 | 25 - 2 | 35 - 3 |
| 6 - 3 | 16 - 2 | 26 - 3 | 36 - 4 |
| 7 - 1 | 17 - 4 | 27 - 4 | 37 - 1 |
| 8 - 1 | 18 - 1 | 28 - 3 | 38 - 2 |
| 9 - 2 | 19 - 3 | 29 - 2 | 39 - **3** |
| 10 - 3 | 20 - 3 | 30 - 1 | 40 - 4 |

## II කොටස

01. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකයද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

i. ස රි ම ප නි
ii. ම ස්වරය හා නි ස්වරය වර්ජිත වන බවත් රාත්‍රී ප්‍රථම ප්‍රහාරයෙහි ගැයෙන බවත් ය.
iii. | ධ ගෙ න ති | න ක ධි න |
iv. රවීන්ද්‍ර ගී / (වංග) / බෙංගාල ගී

- අංක (v) සිට (viii) සිට තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

v. ප්‍රශස්ති
vi. සී. ද එස් කුලතිලක
vii. රේබාව
viii. යානි

- අංක (ix) සිට (x) හි දක්වා ඇති සංගීත භාණ්ඩ සමඟ ගැළපෙන කරුණු දෙක බැගින් වරහන් තුළින් තෝරා අදාළ ප්‍රශ්න අංකය ද සමඟ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

ix. නායකීතාර්, මිස්රාබ්
x. බාජ්කාතාර්, ගජ්

02.

i. A – බිලාවල්
B – යමන්
C - භූපාලි

ii.

| | | | |
|---|---|---|---|
| ස රි ග –<br>සො දු රු යි<br>ස – ග රි<br>සි යො තු න්<br>ග ප ධ ස්<br>ම ල් ගො මු | ග – ග රි<br>සී s ත ල<br>නි රි ග රි<br>ගො එ වී s<br>ධ ප ග –<br>සි ප ඒ s | ග ප ම ග<br>නි ස ල සැ<br>ග රි ග –<br>සැ හ වේ s<br>ග ප ම රි<br>සු ළ හ හ | ම රි ස –<br>ඇ s වේ s<br>ග – ග රි<br>අ දු රේ s<br>ස – – –<br>මා s s s |

iii. නිර්දේශිත මධ්‍යාලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

iv. ම තීව්‍ර වේ.

03.

i. A - භෛරවී
B - කාෆි

ii. දී ඇති ලක්ෂණ ගීත දෙකෙන් එකක හෝ එම රාග දෙකට අදාළ වෙනත් නිර්දේශිත ලක්ෂණ ගීතයක හෝ ස්ථායි කොටස නිවැරදිව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

iii. ජප්තාලය

| තාල සංඥා | x | 2 | 0 | 3 | x |
|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 | 1 |
| ඨේකාව | ධි නා | ධි ධි නා | තී නා | ධි ධි නා | ධි |

04.

i. ගොයම් ගී - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
නෙළුම් ගී - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
කමත් ගී - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ii. ඉහත ගීත වර්ග අතුරින් නිර්දේශිත එක් ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

iii. වන්නම් - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ප්‍රශස්ති - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
හටන් ගී - නිර්දේශිත ගී පාදයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iv.
- ගැමි ගී වල නිර්මාණකරුවෙක් ඇත සේගී වල නැත
- ගැමි ගී වල භාෂාව සරල වන අතර සේගීවල භාෂාව සංකීර්ණ වේ.
- ගැමි ගී වල නාදමාලාව සරල වන අතර සේගීවල නාදමාලාව ගැඹුරු වේ.
- ගීතවර්ග දෙකෙහිම ආසාතාත්මක හා අනාසාතාත්මක ගීත ඇතුළත් වේ.

05.

i.

| | A | B | C | D |
|---|---|---|---|---|
| අ | චිත්‍රපට ගීත | හාරිච්චි - බෝරිච්චි | නාරද දිසාසේකර | ගැටවරයෝ |
| ඇ | ගුවන් විදුලි සරල ගීත | ඕලු පිපීලා විල ලෙල දෙනවා | සුනිල් ශාන්ත | හෙළ රිදී වළාව |
| ඉ | කණ්ඩායම් ගීත | මංගෝ කලු නැන්දේ | ඇනස්ලි මාලේවන | මූන්ස්ටෝන් |
| උ | ග්‍රැමෆෝන් ගීත | පිට දීප දේශ ජය ගන්නා | ලක්ෂ්මී බායි | හිස් මාස්ටර්ස් වොයිස් |

ii. ඇ මුල් කාලීන ගුවන්විදුලි සරල ගී ගායක / ගායිකාවන්
ආනන්ද සමරකෝන්
පී. එල්. ඒ. සෝමපාල
කාන්ති වක්වැල්ල
ස්වර්ණා ද සිල්වා
රෝහිත ජයසිංහ
ඩග්ලස් වික්‍රමසිංහ
ජී. ආර්. එඩ්වඩ්

උ මුල් කාලීන ග්‍රැමෆෝන් ගී ගායක / ගායිකාවන්
ග්‍රේටා ජැනට් ද සිල්වා
එච්. ඩබ්. රූපසිංහ
එන්. රොම්ලස්
ජේ. සාදිරිස් සිල්වා
රුක්මණී දේවි
ඒ. ඩී. ජයමාන්න
රාජ ලක්ෂ්මී
ඉබ්‍රාහිම්
යනාදී නම් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. කණ්ඩායම් ගී
- ගී තනු සීමිත ස්වර පරාසයකින් නිර්මාණය වී ඇත.
- එකම තනුව නැවත නැවත ඇසේ.
- සුසංවාද (හාර්මනි) ක්‍රමය භාවිතා කර ඇත.
- නර්තනශීලී රිද්මයක් ඇත.
- කෝඩ් දෙකක් හෝ තුනක් මත තනු නිර්මාණය වේ.
- භාවිතා කළ සංගීත භාණ්ඩ :- ස්පැනිෂ් ගිටාර්, ගයිරෝ, මර්කාස්, කොංගෝ ඩ්‍රම්ස්, බොංගෝ ඩ්‍රම්ස්, වයලින් ආදිය

iv. සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය වඩාත් සිනමාරූපී සංගීතයක් වේ. "සිනිඳු සුදුමුදු තලාවේ" යන ගීතයම සංගීත සංධ්වනියක් වැනි ය. සාගරයේ රළ නැගෙන බිඳෙන ආකාරය මුහුදුකරයේ ජීවත් වන්නන්ගේ අවිනිශ්චිත ජීවිතය ආදිය ගැන සංගීතඥයා විසින් කරනු ලබන භාවමය ප්‍රකාශනය අති විශිෂ්ටය. සංගීත භාණ්ඩ යොදා ගැනීම, විවිධ තාල රූප ඇසුරු කිරීම බටහිර ශිල්ප ක්‍රම ආදිය යොදා ඇති ආකාරය ඉතා අලංකාර ය. චිත්‍රපටයෙන් පරිබාහිරව ගත්ත ද සංගීත කෘතියක් සේ අගය කළ හැකි මෙම ගීතය රූප රාමු සමඟ බද්ධ වීමේ දී වඩාත් උසස් මට්ටමේ නිර්මාණ ගුණයක් ළඟා කරගෙන ඇත.

06.

i. a - ක්ලැරිනට්

b – ට්‍රම්පට්

c – සැක්සර්ෆෝන්

d - ට්‍රොම්බෝන්

ii.

| Wind Instrument | |
|---|---|
| Wood Wind | Brass wind |
| ක්ලැරිනට් | ට්‍රම්පට් |
| සැක්සර්ෆෝන් | ට්‍රොම්බෝන් |

iii.

| | | | |
|---|---|---|---|
| | | | ස ප |
| ප – – ප | ම පධ – ප | ග – – රි | ම – ස – |

iv. නූර්ති ගීත

v.
- හින්දුස්ථානි සංගීත ආභාසය ලැබීම.
- ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩ ලෙස තබ්ලාව යොදා ගැනීම.
- මීට අමතරව වයලීනය, සර්පිනාව, ඩෝලය වැනි භාණ්ඩ භාවිතය
- ස්ථායි, අන්තරා ආකෘතියෙන් යුක්තවීම.
- නූර්ති ගීතවල දොහොරාව නම් කොටසක් තිබීම.
- හින්දුස්ථානි රාග ඇසුරින් ගී තනු නිර්මාණය කිරීම සහ ගීත සඳහා හින්දුස්ථානි සරල තාල පද වාදනය
- විශ්වනාත් ලව්ජී, ජයා ශංකර්, අබ්දුල් සතාර්, සදු ලාල් වැනි ඉන්දීය සංගීතඥයින් විසින් ගීත සඳහා සංගීත නිර්මාණය කිරීම ආදිය ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

07. දී ඇති කරුණු වලට අදාළව පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

# LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න
## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර



- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440